රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය

1. හැඳින්වීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය යනුවෙන් අදහස් කරන්නේ කිසියම් රටක රාජ්‍ය භාෂාව හෝ රාජ්‍ය භාෂා සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියයි. භාෂා භාවිතය, ඒවායේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සම්බන්ධයෙන් රජය විසින් ගනු ලබන තීරණ ප්‍රකාශයට පත්වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මගිනි. බහු භාෂික සමාජයක් තුළ සාමය සහ සංහිඳියාව ඇති කරලනු වස් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය බෙහෙවින් වැදගත් වේ. එමගින් පුරවැසියන්ගේ භාෂා භාවිතය සඳහා පහසුකම් සැලසීම හා පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් සුරැකීම මෙන්ම සංස්කෘතික බැඳීම සඳහා ද ප්‍රතිපාදන සැලසේ.

ලොව විවිධ රටවල් සිය පුරවැසියාගේ භාෂා භාවිතය සහ භාෂා අයිතිවාසිකම් සුරැකීම උදෙසා විවිධාකාර වූ ප්‍රතිපත්තීන් අනුගමනය කරයි. ශ්‍රී ලංකාව මෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවැති කැනඩාවේ රාජ්‍ය භාෂාවන් ඉංග්‍රීසි සහ ප්‍රංශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර සියලුම රාජ්‍ය ආයතන සහ පාර්ලිමේන්තුවේ දී එම භාෂා දෙකටම සම තත්ත්වයක් ලබා දී ඇත. ස්විට්සර්ලන්තයේ ජර්මන්, ප්‍රංශ, ඉතාලි සහ රොමාන්ෂ් යන භාෂා හතරම රාජ්‍ය භාෂාවන් වේ. දකුණු අප්‍රිකාවේ දළ වශයෙන් භාෂා 25ක් පමණ භාවිත වන අතර ඉන් 11ක් රාජ්‍ය භාෂා ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. බොලීවියාවේ රාජ්‍ය භාෂාවන් 37ක් භාවිත වන අතර ලොව වැඩිම රාජ්‍ය භාෂාවන් සංඛ්‍යාවක් භාවිත වන රට ලෙස එය ගිනස් වාර්තාවට ද ඇතුළත් වී ඇත. සමහර රටවල් රාජ්‍ය භාෂාවක් ලෙස කිසිදු භාෂාවක් ප්‍රකාශයට පත්කර නැත. ඕස්ට්‍රේලියාව, එරිත්‍රියාව,ලක්සම්බර්ග්, ස්විඩනය සහ ටුවාලු යන රටවල් වල කිසිදු භාෂාවකට රාජ්‍ය භාෂාවක තත්ත්වය ලබා දී නොමැත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවන් ලෙස සිංහල සහ දෙමළ ප්‍රකාශයට පත්කර ඇති අතර ඒවා ජාතික භාෂා වශයෙන් ද නම් කර ඇත.

2. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවේ භාෂා භාවිතය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ගත් කල බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ පටන්ම ක්‍රමිකව විකාශනය වී ඇති අයුරු නිරීක්ෂණය කළ හැකිය. ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ සිය පාලනයට නතු කරගත් පෘතුගීසීන්ට සහ ලන්දේසීන්ට සිය භාෂාවන් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීමට අවකාශ නොලැබිණි. 1796 දී ලන්දේසීන් පලවා හැර ඉංග්‍රීසින් එම ප්‍රදේශවල බලය අත්පත් කරගැනීමෙන් පසු ඔවුන් ඉංග්‍රීසි භාෂාවේ දැඩි අවශ්‍යතාව

අවධාරණය කළ අතර එවකට ආණ්ඩුකාර ධූරය දැරූ ෆෙඩ්රික් නෝර්ත් ඉංග්‍රීසි භාෂාව ද මූලික කරගත් භාෂා ප්‍රතිපත්තිය හඳුන්වා දීමට කටයුතු කළේය. එහෙත් භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ නිල වශයෙන් ප්‍රකාශයට පත් වන්නේ 1832 කෝල්බෲක් වාර්තාව මගිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය පාලනය, අධ්‍යාපනය මෙන්ම අධිකරණයේ භාෂාව වශයෙන් ඉංග්‍රීසි භාෂාව භාවිත කිරීම දිරිමත් කිරීමට බ්‍රිතාන්‍ය පාලනය විසින් පියවර ගන්නා ලදී. ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ආරම්භ කිරීම එහි එක් ප්‍රතිඵලයකි. එහෙත් ස්වභාෂාවන් පිළිබඳ අවබෝධයක් නොතිබීම බ්‍රිතාන්‍යයන්ට අවාසිදායක තත්ත්වයක් උදාකරලීය. එහෙයින් සියලු රජයේ සේවකයන්ට සිය උසස්වීම් සඳහා සිංහල සහ පෘතුගීසි භාෂා පිළිබඳ ප්‍රවීණතාව ලබා ගැනීම අනිවාර්ය කරමින් රෙගුලාසි හඳුන්වා දෙන ලදී. එහෙත් දෙමළ භාෂා ප්‍රවීණතාව පිළිබඳ අවධානය යොමු නොවිණි. 1824 දී පෘතුගීසි භාෂාව ද අතහැර දමනු ලැබූ අතර ජනගහනයෙන් වැඩි පිරිසකට ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව නොවූයෙන් පරිපාලන කටයුතු වල දී සුළු වශයෙන් සිංහල භාෂාව ද භාවිතයට ගන්නා ලදී. නිදසුන් ලෙස රජයේ ආඥා පනත් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කෙරුණු අතර ඒවා සිංහල භාෂාවට ද පරිවර්තනය කරන ලදී . පරිපාලනයේ පහසුව තකා ශ්‍රී ලංකාව පළාත් 9කට බෙදා වෙන් කළ අතර උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශ ලෙසත් අනෙකුත් සියලු ප්‍රදේශ සිංහල භාෂාව භාවිත කරන ප්‍රදේශ ලෙසත් නම් කරන ලදී . ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව නොමැති කිසිදු ස්වදේශිකයෙකු ගම්මුලාදෑනි තනතුරට බඳවා ගත නොගත යුතු බවට 1828 දී රෙගුලාසි පැනවූ අතර සිවිල් සේවයේ උසස්වීම් සඳහා සිංහල හා දෙමළ භාෂාවල ප්‍රවීණතාව අවධාරණය කෙරිණි.

කෙසේ වෙතත් ස්වදේශ භාෂා ඉගෙනීම සහ භාවිතය බොහෝ බ්‍රිතාන්‍යයන් විසින් නොසලකා හරින ලදි. එහෙයින් ඔවුන් තමාට ඉතා විශ්වාසවන්ත වූ පුද්ගලයන් කිහිප දෙනෙකු පමණක් ස්වදේශිකයන් සමග සන්නිවේදන කටයුතු සඳහා අතරමැදියන් ලෙස යොදා ගන්නා ලදී. පසු කලෙක ඔවුන් තෝල්ක වරුන් ලෙස නම් කරන ලදී.

බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල් කාලයේදී දේශීය භාෂා පිළිබඳ ප්‍රවීණතාව අනිවාර්ය කෙරුණ ද, ඒ සම්බන්ධයෙන් නීති පනවනු නොලැබිණි. 1870 දී සිවිල් සේවා විභාගය හඳුන්වාදීමෙන් පසු සිංහල හෝ දෙමළ භාෂා ප්‍රවීණතාව නොමැති කිසිදු නිලධාරියෙකු ඉහළ නිලයකට උසස් නොකිරීමට තීරණය කරන ලදි. එහෙයින් එවැනි නිලධරයන් සඳහා සිංහල සහ දෙමළ භාෂා ඉගෙනීමට රජය විසින් පහසුකම් සලසා දෙන ලදී.

1931 දී ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ස්වභාෂා උගත් පිරිස මෙන්ම දේශපාලන නායකයෝ ද ස්වභාෂා කෙරෙහි උනන්දුවක් දැක්වීමට පෙළඹුණහ. ඉංග්‍රීසි වෙනුවට සිංහල සහ දෙමළ භාෂා යොදාගැනීමට රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත යෝජනා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 1943 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයකු ලෙස ජේ. ආර් . ජයවර්ධන මහතා විසින් සිංහල

රාජ්‍ය භාෂාවක් බවට පත් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ඊට දෙමළ භාෂාව ද ඇතුළත් විය යුතු බවට විවිධ යෝජනා ඉදිරිපත් වූයෙන් එම සංශෝධන ද සහිතව 1944 දී එම යෝජනාව ඉදිරිපත් කළ අතර එය සභා සම්මත විය. ඉන්පසු ඊට අදාළ කටයුතු කිරීම සඳහා 1945දී ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය භාෂා කාරක සභාවක් පත් කරන ලදී. එම කාරක සභාවේ වාර්තා මගින් සිංහල සහ දෙමළ රාජ්‍ය භාෂා බවට පත් කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලද නමුත් එය ක්‍රියාත්මක නොවීය.

3. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙන් පසු ශ්‍රී ලංකාවේ භාෂා භාවිතය

1948 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ භාෂා ප්‍රතිපත්තියේ ප්‍රතිසංස්කරණ කිහිපයක්ම සිදු වූ අතර ඒවා පහත පරිදි හඳුනා ගත හැකිය.

- 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත
- 1957 බණ්ඩාරනායක- චෙල්වනායගම් ගිවිසුම
- 1958 අංක 28 දරන දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත
- 1965 සේනානායක- චෙල්වනායගම් ගිවිසුම
- 1966 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) රෙගුලාසි
- 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1987 දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
- 1988 දහසයවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම මගින් දේශපාලනික, සංස්කෘතික, ජනවාර්ගික මෙන්ම භාෂාමය ගැටලු රාශියක් පැන නැගිණි. "සිංහල පමණක්" යන රජයේ ප්‍රතිපත්තිය නිසා මෙරට සුළු ජන කොටස් බොහොමයක් පීඩාවට පත් වූ අතර පසුකාලීනව උද්ගත වූ යුද ගැටුම් වලට පවා මෙය හේතු විය.

සිංහල පමණක් රාජ්‍ය භාෂාව බවට පත්වීමෙන් සිංහල කතා නොකරන ජනතාව පමණක් නොව සිංහල කතා කරන ජනතාව පවා විවිධ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දුන්හ. මෙම පනත ක්‍රියාත්මක වීමත් සමඟම සියලුම රජයේ කාර්යාලවල සිංහලෙන් පමණක් කටයුතු කිරීමට සිදු වූ අතර එසේ කිරීමට නොහැකි

වූ නිලධාරීන්ට විශ්‍රාම ගැනීමේ විකල්ප ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඊට අමතරව අලුතෙන් රාජ්‍ය සේවයට එක් වූ සිංහල කතා නොකරන නිලධාරීන්ට සේවයේ ස්ථිර කිරීමට පොරොතුව සිංහල භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට නියම කරන ලදී. එහෙයින් ඉංග්‍රීසි භාෂාව උගත් දෙමළ රජයේ සේවකයන් බොහොමයක් රාජ්‍ය සේවයෙන් නික්ම ගිය අතර සිංහල ඉගෙනීමට අකමැති වූ දෙමළ ජාතිකයන් රාජ්‍ය සේවයට එක්වීම සීමාසහිත විය. මෙම පනත මැනවින් ක්‍රියාත්මක කිරීම උදෙසා 1956 දී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පිහිට වූ අතර ප්‍රධාන කාර්යයන් බවට පත්වූයේ,

- රජයට සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් භාෂා පරිවර්තන ලබාදීම
- පාරිභාෂික පද මාලා සම්පාදනය
- ඉංග්‍රීසි භාෂාවෙන් පැවැති ග්‍රන්ථ සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ
- රජයේ නිලධාරීන්ට සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම යි.

1956 රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක වීම නිසා රටෙහි ඇතිවූ නොසන්සුන්තාව සමනය කිරීමේ අරමුණින් එවකට අග්‍රාමාත්‍ය ධූරය දැරූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක මහතා සහ ෆෙඩරල් පක්ෂයේ නායකත්වය දැරූ එස්. ජේ. වී චෙල්වනායගම් අතර ඇතිවූ සාකච්ඡාවකින් පසු ඇතිකර ගත් එකඟතාවන් 1957 බණ්ඩාරනායක -චෙල්වනායගම් ගිවිසුමෙහි සඳහන් වේ. එහිදී රාජ්‍ය භාෂාවේ තත්ත්වයට හානිකර නොවන අන්දමින් උතුරු නැගෙනහිර පළාත්වල පරිපාලන භාෂාව ලෙස දෙමළ භාෂාව භාවිත කිරීමට ප්‍රතිපාදන සැලසීමට එකඟතාවකට එළඹෙන ලදී.

ඉන්පසු 1958 දී දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත හඳුන්වා දෙන ලදී. මෙම පනත මගින් 1956 පනතට පටහැනි නොවන සේ ශ්‍රී ලංකාවේ දෙමළ භාෂා භාවිතය සඳහා විධිවිධාන සලසන ලදී . එමගින් දෙමළ භාෂාව අධ්‍යාපනය ලැබීමේ මාධ්‍යයක් ලෙස, රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී විභාග පැවැත්වීමේ මාධ්‍යයක් ලෙස, උතුරු නැගෙනහිර මෙන්ම සෙසු පළාත්වල ද පළාත් පාලන ආයතනවල දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ කිසියම් නිල තත්ත්වයකින් යුත් අයෙකු හා ඊට සමාන නිල තත්ත්වයකින් හෙබි අයෙකු අතර සන්නිවේදනය සඳහා දෙමළ භාෂාව භාවිත කිරීම සහ උතුරු නැගෙනහිර පළාත්වල පරිපාලන කටයුතු සඳහා දෙමළ භාෂාව යොදා ගැනීමට ප්‍රතිපාදන සලසා දෙන ලදී.

1965 දී ඩඩ්ලි සේනානායක මහතා සහ චෙල්වනායගම් මහතා අතර එකඟතාවක් ඇතිකර ගන්නා ලදී. එහිදී උතුරු නැගෙනහිර පළාත්වල පරිපාලන සහ වාර්තා කරන භාෂාව ලෙස දෙමළ භාෂාව යොදා ගැනීමට දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත යටතේ කඩිනම් පියවර ගැනීමට එකඟවිය. උතුරු නැගෙනහිර පළාත්වල නෛතික කටයුතු දෙමළ භාෂාවෙන් සිදු කිරීම සහ වාර්තා කිරීම සඳහා භාෂා ප්‍රතිපාදන සලසනු

වස් අධිකරණ පනත සංශෝධනය කිරීමට ද එකඟතාව පළවිය. ඒ සඳහා 1966 දී දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) රෙගුලාසි සකස් කළ අතර 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතට අනුකූලව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් පවතින අතර උතුරු නැගෙනහිර පළාත්වල රජයේ පරිපාලන කටයුතු සහ වාර්තා පවත්වාගෙන යෑමට රාජ්‍ය ආයතන දෙමළ භාෂාව භාවිත කළ යුතු බවටත් දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ නිලධාරියෙකු පළාත් පාලන ආයතනයක දී එවැනිම නිලයක් දරන නිලධරයකු හා නිල කටයුතු වෙනුවෙන් දෙමළ භාෂාව භාවිත කළ යුතු බවත් 1958 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස සියලුම ආඥා, නීති, රජයේ ගැසට් පත්‍ර, රජයේ, සංස්ථා හා සංස්ථාපිත ආයතන වල සියලු ප්‍රකාශන දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමටත් රෙගුලාසි හඳුන්වා දෙන ලදී.

1972 දී ප්‍රථම දේශීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දුන් අතර එමගින් දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත අත්හැර දමන ලදී. එහි භාෂාව පිළිබඳ තුන්වැනි පරිච්ඡේදයෙන් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනුණු අතර උතුරු හා නැගෙනහිර පළාත් වල සාධාරණ හේතූන් මත දෙමළ භාෂාව භාවිත කිරීමට අවසර ලබාදී තිබිණ. නීති පැනවීමේ භාෂාව ද සිංහල භාෂාව වන අතර එසේ පනවනු ලබන සෑම නීතියකම සහ සෑම අනුනීතියකම දෙමළ පරිවර්තනයක් ලබාදිය යුතු බවට ප්‍රතිපාදන සලසන ලදී.

4. වත්මන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය

1978 දී ශ්‍රී ලංකාවේ දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වශයෙන් එළිදැක්වුණු මෙහි III පරිච්ඡේදයේ භාෂාව මූලික අයිතිවාසිකමක් ලෙස දැක්වෙන අතර කිසිම පුරවැසියෙකු භාෂාව මත වෙනසකට හෝ විශේෂයකට බඳුන් නොවිය යුතු බව දක්වා ඇත .

තවද එහි IV වන පරිච්ඡේදයේ භාෂාව පිළිබඳ මූලික නීතිය දක්වා ඇති අතර එහි විධිවිධාන 1987 වර්ෂයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ 1988 වර්ෂයේ 16 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධනය වී ඇත. 13 වන සංශෝධනයෙන් සංශෝධිත 18 (1) හා18 (2) ව්‍යවස්ථා අනුව සිංහල සහ දෙමළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වන අතර 18 (3) ව්‍යවස්ථාවෙන් ඉංග්‍රීසි සන්ධාන භාෂාව ලෙස දක්වා තිබේ. 16 වන සංශෝධනයෙන් සංශෝධිත 20 වන ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකුට හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයෙකුට හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකුට පිළිවෙලින් පාර්ලිමේන්තුවේ හෝ ඒ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුවද තමාගේ කාර්යය සහ කර්තව්‍යය ඉටු කිරීමට හිමිකම ඇති බව දක්වා ඇත.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථාව අනුව සිංහල භාෂාව සහ දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වශයෙන් ද පිළිගෙන ඇත .

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන ව්‍යවස්ථාව මගින් ඉගැන්වීමේ මාධ්‍යය පිළිබඳ ප්‍රතිපාදන දක්වා ඇත. ඒ අනුව,

> 21(1) ව්‍යවස්ථාව: සෑම තැනැත්තෙකුටම ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුවද අධ්‍යාපනය ලැබීමට හිමිකම ඇත එහෙත් ජාතික භාෂාවක් නොවන භාෂාවක් ඉගැන්වීමේ මාධ්‍යය වන උසස් අධ්‍යාපන ආයතනයකට මෙය අදාළ නොවේ.

> 21(2) ව්‍යවස්ථාව: රජය විසින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් හෝ මුදල් සපයනු ලබන විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් සඳහා නැතහොත් යම් අංශයක, පීඨයක ඉගැන්වීමේ මාධ්‍යය එක් ජාතික භාෂාවක් වන විට එම විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට කලින් අනෙක් ජාතික භාෂාවෙන් අධ්‍යාපනය ලබා ඇති ශිෂ්‍යයන් වෙනුවෙන් අනෙක් ජාතික භාෂාව ද ගැන්වීමේ මාධ්‍යය බවට පත් කළ යුතුය.

16 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත 22(1) ව්‍යවස්ථාව අනුව සිංහල සහ දෙමළ ශ්‍රී ලංකාව මුළුල්ලේම පරිපාලන භාෂා වේ. රජයේ ආයතන විසින් පොදු වාර්තා තබා ගැනීම සහ සියලු කටයුතු සඳහා දෙමළ භාෂාව භාවිත කරන උතුරු නැගෙනහිර හැර ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල පරිපාලන භාෂාව සිංහල වේ. 23 වන ව්‍යවස්ථාව අනුව සියලුම නීති සහ අනුනීති පැනවීමේ භාෂාව සිංහල සහ දෙමළ භාෂාවෙන් විය යුතු අතර එහි ඉංග්‍රීසි පරිවර්තනයක් පැවතිය යුතුය. ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාව මුළුල්ලේම අධිකරණවල භාෂා සිංහල සහ දෙමළ භාෂා විය යුතු අතර නඩු වාර්තා සහ නඩු කටයුතු රාජ්‍ය භාෂා වලින් පැවතිය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන පරිදි භාෂා භාවිතය සඳහා රජය ප්‍රමාණවත් පහසුකම් ලබා දිය යුතු බව එහි 25 වන ව්‍යවස්ථාවේ සඳහන් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කර ඇති පරිදි භාෂාව පිළිබඳ මූලික නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් පියවරයන් රැසක් මේ වනවිට ගනු ලැබ ඇත

(1) ද්වි භාෂා ෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නම් කිරීම

මේ වන විට ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 41ක් ගැසට් කර ඇති අතර තවත් 31ක් ක් ගැසට් කිරීමට යෝජිතය

(2) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ චක්‍රලේඛ ලිපි නිකුත් කිරීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් කලින් කලට චක්‍රලේඛ සහ චක්‍රලේඛ නිකුත් ලිපි නිකුත් කර ඇති අතර ඒවායින් කිහිපයක් පහත පරිදි වේ

- **රා.ප. චක්‍රලේඛ 12/2003-** භාෂා පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය
- **රා.ප. චක්‍රලේඛ 03/2010 -** ආයතන විසින් ලිපි ගනුදෙනු කිරීමේදී අනුගමනය කළ යුතු විධිවිධාන
- **රා.ප. චක්‍රලේඛ 18/2009 -**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරීම

  භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන ප්‍රධානීන්ට මෙමගින් වගකීම පවරා ඇති අතර අංක 1620 දරන 2009.09.25 දිනැති ගැසට් නිවේදනය ද නිකුත් කර ඇත.

- **රාජ්‍ය /පළාත් රාජ්‍ය නිලධාරීන් සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ**

මේ සම්බන්ධයෙන් විටින් විට රා.ප. චක්‍රලේඛ 07/2007 , 3/2007 සහ 1/2014 සහ කළමනාකරණ චක්‍ර චක්‍රලේඛ 4/2014 නිකුත් කරන ලද අතර එමගින් 2007 වර්ෂයෙන් පසු රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයට බැඳුණු නිලධාරීන්ටද 2013 වර්ෂයෙන් පසු සේවයට බැඳුණු අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට ද අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා ලිඛිත සහ වාචික පරීක්ෂණය අනිවාර්ය කෙරුණි. මේ වනවිට එම චක්‍රලේඛ අවලංගු කර ඒ වෙනුවට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2023 නිකුත් කර ඇත. 2007 වර්ෂයෙන් පසු රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයට බැඳුණු සියලු නිලධාරීන්ට සහ 2013 වර්ෂයෙන් පසු සේවයට බැඳුණු අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ පාඨමාලාවක් හදාරා සිය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.

- **රා.ප. චක්‍රලේඛ 12/2003**: සියලු රාජ්‍ය ආයතන වල ආකෘතිපත්‍ර සිංහල සහ දෙමළ ඉංග්‍රීසි යන භාෂා තිබිය යුතුය.
- **රා.ප. චක්‍රලේඛ 22/91 :**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ආයතන වලට පැවරීම

  - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

පසුකාලීනව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කිරීමට අදාලව භාෂා පුහුණු ආයතනය වශයෙන් 2007 වර්ෂයේදී ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ස්ථාපිත කරන ලදී.

- ***රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව***

1956 දී ස්ථාපිත කරන ලදී. රාජ්‍ය /පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සහ පුහුණු පාඨමාලා පැවැත්වීම, රජයේ නිල භාෂා පරිවර්තකයා වශයෙන් රජයට සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පරිවර්තන සැපයීම ,පාරිභාෂික පදමාලා සම්පාදනය සහ භාෂා ඉගෙනුම් ආධාරක සකස් කිරීම මෙහි මුඛ්‍ය කාර්යභාරය වේ

- ***රාජ්‍ය භාෂා කොමිෂන් සභාව***

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 දී ස්ථාපිත කෙරුණු අතර එහි කාර්යභාරය ප්‍රධාන අරමුණු හතරක් ඔස්සේ පෙළගස්වා ඇත

- **විමර්ශනය -** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි විභාග කිරීම.

- **අධීක්ෂණය-** රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න ගැන විමසිලිමත් වීම.

- **අධ්‍යාපනය-** අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම.

- **උපදේශනය -** ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය සඳහා අවශ්‍ය කොමිෂන් සභා නිර්දේශ රජය වෙත ලබා දීම.

- ***ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය***

සිංහල, දෙමළ ඉංග්‍රීසි යන භාෂා ඉගැන්වීමට සුදුසු දක්ෂ ගුරුවරුන් බිහි කිරීම, භාෂා පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් බිහිකිරීම, ත්‍රෛභාෂා හැකියාව ඇති නිලධාරීන් පුහුණු කිරීම 2007 දී ස්ථාපිත කෙරුණු මෙම ආයතනයේ මුඛ්‍ය පරමාර්ථ වේ.

(3) ජනාධිපති විසින් නිකුත් කළ ලිපිය

1997 ජුනි 30 දින එවකට සිටි ගරු ජනාධිපති විසින් සියලුම අමාත්‍යවරුන් ලේකම්වරුන් ආයතන ප්‍රධානීන් වෙත "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් ලිපියක් නිකුත් කරන ලදී. රාජ්‍ය ආයතන වල සියලුම රෙගුලාසි, නෛතික ප්‍රතිපාදන, තොරතුරු සහ ආකෘති පත්‍ර භාෂා ත්‍රිත්වයෙන් තිබිය යුතු බවත් රජයේ ආයතනයකට ලැබෙන ලිපියකට එකී ලිපියේ භාෂාවෙන්ම පිළිතුරු යැවිය යුතු බවත්, සියලුම රාජ්‍ය ආයතන වල නාම පුවරු, මගපෙන්වීම් පුවරු ඇතුළු වෙනත් උපදෙස් භාෂා ත්‍රිත්වයෙන් තිබිය යුතු බවත්, සිංහල -දෙමළ භාෂා පරිවර්තකයන්ගේ තනතුරු පුරප්පාඩු ඉක්මනින් පිරවිය යුතු බවත්, භාෂාව සම්බන්ධ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරීම සඳහා සෑම ආයතනයක ජ්‍යෝෂ්ඨ නිලධාරියකු හඳුනා ගත යුතු බවත් එම ලිපිය මගින් අවධාරණය කර ඇත

(4) කැබිනට් තීරණ

සිංහල භාෂා පාඨ පමණක් යෙදූ රජයේ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා දෙමළ භාෂා පාඨ ද යෙදිය යුතුවේ. රජයේ ආයතනවලට මේ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහාය ලබා දිය යුතුය.(2018 /04/09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය)

සෑම වර්ෂයකම ජූලි 01 රාජ්‍ය භාෂා දිනය ලෙසත් ජූලි 1 සිට ජූලි 5 දක්වා රාජ්‍ය භාෂා සතිය ලෙසත් නම් කිරීම (2009/05/31/ දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය)

(5) 1956 භාෂා ඇමතුම් මධ්‍යස්ථානය පිහිටුවීම

මේ ඔස්සේ භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට හැකියාව ඇත

(6) අන්තර්ජාතික සම්මුති

ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ අන්තර්ජාතික ප්‍රඥප්තියට 1980 දී එකඟත්වය ලබා දී ඇත

(5) භාෂා අයිතිවාසිකම් උල්ලංඝනයවීම සම්බන්ධයෙන් පියවර ගැනීම

භාෂාව මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගෙන ඇති බැවින් භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වුවහොත් පහත ආකාරයෙන් කටයුතු කළ හැකිය

- රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට පැමිණිලි කිරීම
- ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සහන ගැනීම
- මහාධිකරණයන් සහන ලබා ගැනීම
- මහේස්ත්‍රාත් අධිකරණයේ සහාය ලබා ගැනීම
- මානව හිමිකම් කමිෂන් සභාවට පැමිණිලි කිරීම
- මහජන පෙත්සම් කාරක සභාවට පැමිණිලි කිරීම
- ඕම්බුඩ්ස්මන්වර්යාගේ සහය ලබා ගැනිම

මේ අනුව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මැනවින් ක්‍රියාත්මක කිරීම සඳහා කලින් කලට විවිධ පියවර රැසක් ගෙන ඇති බව පැහැදිලිය. ජාතින් අතර සමගිය සහ සංහිදියාව උදෙසා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මැනවින් ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා ජාතික සැලැස්මක් සකස් විය යුතුය. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මැනවින් ක්‍රියාත්මක වන කල්හි ''එකම රටක් එකම දැයක්'' යන්න යථාර්ථයක් බවට පත්කර ගත හැකි වනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන

කෝපරහේවා,සඳගෝමි, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය සහ ගමන් මග -

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ ඒ සම්බන්ධ නීතිය - ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය- මාර්ගෝප දේශ සංග්‍රහය - රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

ස්කන්ධකුමාර්,බි , ශ්‍රී ලංකාවේ භාෂා අයිතිවාසිකම්- දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් ලෙස බලාත්මක කිරීම

Coperahewa, Sandagomi "Colonialism and problems of language policy: formulation of a colonial language policy in Sri Lanka"

Gunasena, Senarath " Language Policy : An Overview of the Sri Lankan experience"

සැනෝජි රුවිනිකා පෙරේරා

කොමසාරිස්